# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
## පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
## ඉංග්‍රීසි භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම

මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් ආරම්භ කිරීමට නියමිත ඉංග්‍රීසි භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව සඳහා නවක සිසුන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඉංග්‍රීසි භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව (බාහිර) - Advanced Certificate in English (External)**

- පාඨමාලා කාලය : මාස - 08
- SLQF ස්තරය : 02 වන ස්තරය (Level 02)
- ඉගැන්වීම් මාධ්‍යය : ඉංග්‍රීසි
- **මූලික සුදුසුකම් :**
  1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) / මූලික පිරිවෙන් අවසන් විභාගයේ ඉංග්‍රීසි විෂය (සාමාන්‍ය "S" සාමර්ථ්‍යයක් තිබීම ප්‍රමාණවත් වේ) සහිතව විෂයන් හයක් (06) සමත් වීම.
     **හෝ**
  2. ඒ හා සමාන පිළිගත හැකි වෙනත් සුදුසුකම් ලබා තිබීම.
     **හෝ**
  3. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය සනාතන සභාව පිළිගන්නා වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.
- පාඨමාලා ගාස්තුව : අයදුම්පත් ගාස්තුව - රු. 500.00
  පාඨමාලා ගාස්තුව - රු. 19,500.00

  * (පාඨමාලා ගාස්තුව වාරික දෙකකින් ගෙවිය හැකිය. පළමු වාරිකය රු. 14,500/-කි. එය ලියාපදිංචි වීමේදී ගෙවිය යුතු අතර ඉතිරි මුදල පාඨමාලාව ආරම්භ වී මාස දෙකක් ඇතුළත ගෙවිය යුතුය.)

- මෙම පාඨමාලා සඳහා ඉහත දක්වා ඇති අදාළ සුදුසුකම් සපුරන ගිහි/පැවිදි/ස්ත්‍රී/පුරුෂ ඕනෑම අයෙකුට ඉල්ලුම් කළ හැකිය.
- පාඨමාලා සඳහා මාර්ගගත ක්‍රමයට (Online) හෝ සම්මුඛ ක්‍රමයට සම්බන්ධ විය හැක.
- පාඨමාලා ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් ශිෂ්‍ය පිරිසක් අයදුම්කර තිබිය යුතුය.
- අයදුම්පත් භාර ගන්න අවසාන දිනය 2024.06.30 වේ.

**පාඨමාලා සඳහා අයදුම්පත් යොමු කිරීම**

- විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියට (www.busl.ac.lk) පිවිස මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් ඉදිරිපත් කිරීම පෙර **පියවර 01** යටතේ ලබා දී ඇති සබැඳිය (Link) https://forms.gle/UkrwsyAGNU97R7RM9 ක්ලික් (Click) කර අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව යොමු අංකයක් (Reference Number) ලබා ගත යුතුය.
- ඉන් පසු ලබා දී ආකෘතිය අනුව යොමු අංකය (Reference Number) නිවැරදිව සඳහන් කර මහජන බැංකුවේ දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අංක 008-1001-7001-4461 දරන ගිණුමට අයදුම්පත් ගාස්තුව බැර කරන්න.
- අයදුම්පත පිරවීමට ප්‍රථම, උපදෙස් හොඳින් කියවා පහත ලියකියවිලිවල පරිලෝකන පිටපත් (Scan Copy) ලබා ගැනීම සිදු කළ යුතු අතර ඒවා pdf ආකෘතියට තිබිය යුතුය.
  - ➢ උප්පැන්න සහතිකය
  - ➢ පැවිදි අයදුම්කරුවන් සඳහා සාමණේර/උපසම්පදා සහතිකය
  - ➢ ජාතික හැඳුනුම්පත
  - ➢ අධ්‍යාපන සහතික
  - ➢ අයදුම්පත් ගාස්තු ගෙවූ ලදුපත
- ඉහත කී සියලුම ලියකියවිලි සකස් කර ගත් පසු **පියවර 02** යටතේ ලබා දී ඇති සබැඳිය (Link) https://forms.gle/vRk2FNTNTwdin9aX8 ක්ලික් (Click) කර ගූගල් පෝරමයේ ඇති ප්‍රශ්නවලට නිවැරදි තොරතුරු ඉදිරිපත් කර 2024.06.30 දින දක්වා අයදුම්පත් යොමු කල හැකිය.

වැඩි විස්තර - පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය (025-2057978)
විශ්වවිද්‍යාල වෙබ් අඩවිය (www.busl.ac.lk)

ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුරය.